(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(1).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 මැයි 09 සිකුරාදා**

---

**2025 මැයි 20 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (1) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නිවේදනය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 මැයි 22 බ්‍රහස්පතින්දා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 ජූනි 03 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

305/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව සහ එක් එක් පීඨයේ සිටින සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ විශ්වවිද්‍යාලයක එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(v) එක් එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එක් පෞද්ගලික විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු සඳහා වැය වන මුළු පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරුන් සංඛ්‍යාව සහ මහාචාර්යවරුන්ගේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රජයේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය කොපමණද;

(iii) ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු සඳහා වැයවන මුළු පිරිවැය කොපමණද;

(iv) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම කොපමණද;

(v) ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ඉහත එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය කවරේද;

යන්නත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

381/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පසුගිය රජය විසින් ජාතික පාසල් බවට පත් කර ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

513/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වැව් අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

585/2025

ගරු අජිත් ගිහාන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අයහපත් පාරිසරික තත්ත්වයන් යටතේ වුවද, එළවළු හා පලතුරු නිෂ්පාදනය කරනු ලබන කලාපයක් ලෙස කල්පිටිය හැඳින්විය හැකි බවත්;

(ii) වර්ෂා කාලවලදී ගොවිබිම් ජලයට යට වී, අස්වනු විනාශයට පත්වීම හේතුවෙන් එම ප්‍රදේශයේ ගොවි ජනතාව විශාල ලෙස අපහසුතාවයට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, වර්ෂාව හේතුවෙන් විනාශයට පත්වන අස්වනු වෙනුවෙන් එම ගොවීන්ට වන්දි ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) කල්පිටියේ එළවළු සහ පලතුරු ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

791/2025

ගරු සුජීව දිසානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වෙලංගොල්ල වත්ත (හාමුගේ වත්ත) යන රජයේ ඉඩමේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ඉඩමේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(iii) එම ඉඩම කර්මාන්ත සඳහා ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම කර්මාන්ත කවරේද;

(v) කර්මාන්ත සඳහා ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(vi) එම කර්මාන්තවල සේවක ධාරිතාවය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

801/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) "දැයට කිරුළ" වැඩසටහන යටතේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය තුළ ඉදිකිරීම් ආරම්භ කරන ලද විශාල උත්සව ශාලාවේ ඉදිකිරීම් අර්ධ වශයෙන් නිම කර, අතරමග නවතා ඇති බව දන්නේද;

(ii) එම ගොඩනැගිල්ල සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) කුලියාපිටිය ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත්වන ඉහත උත්සව ශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ඒ සඳහා වැයවන මුදල ගණනය කර තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

836/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද මහා ඇළ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සමන්විතවන අදියර සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙන් ආවරණය කරනු ලබන දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වූ බව පිළිගන්නේද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබූ වර්ෂය කවරේද;

(iii) නියමිත කාලය තුළ එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වීමට හේතු කවරේද;

(iv) මේ වනවිට එම ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

869/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අවස්ථාවේ, එම කොමිෂන් සභාවට පවරා දෙන ලද දකුණු පළාතේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට පුද්ගලික අයිතියට පවරා දී ඇති අක්කර 50ට අඩු ඉඩම් සංඛ්‍යාව, එම එක් එක් ඉඩමේ විශාලත්වය, ඉඩම පවරා දී ඇති පුද්ගලයාගේ නම සහ ඉඩම පවරා දී ඇත්තේ කෘෂිකාර්මික කටයුතු සඳහාද නැතහොත් ව්‍යාපාරික කටයුතු සඳහාද යන්න එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනතෙක් පවරා හෝ බැහැර කර නොමැති ඉඩම්වල නම් හා ඒවායේ විශාලත්වය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඉඩම් අතරින් මේ වනවිට අධිකරණ ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතින ඉඩම් කවරේද;

(v) නව ව්‍යාපෘති සඳහා ඉල්ලා ඇති ඉඩම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන විසින් භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම දේපළ අතරින් පළාත් පාලන ආයතනය විසින් නීත්‍යානුකූලව භුක්ති විඳින නිශ්චල දේපළ ප්‍රමාණය සහ නීත්‍යානුකූල නොවන ආකාරයට භුක්ති විඳින නිශ්චල දේපළ ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පළාත් පාලන ආයතන විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට භුක්ති විඳින නිශ්චල දේපළ තිබේ නම්, ඒවා නීත්‍යානුකූල කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලවකවානුව තුළ රජයේ "දීමනා පත්‍ර" හෝ "ඉඩම් බලපත්‍ර" ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජුනි 04 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

514/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රැඳවුම්භාරයේ සිටින දේශපාලන සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දේශපාලන සිරකරුවා රඳවාගෙන සිටින කාලය, එරෙහිව ඇති චෝදනා, රඳවා ගැනීමට භාවිතා කර ඇති පනත වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සඳහා ඇති සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

517/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට ජාතික පාසල් ලෙස නම් කරන ලද පාසල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසලේ නාම පුවරුව හා ප්‍රධාන පිවිසුම් දොරටුව සැකසීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම පාසල් පාලනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය මඟින්ද; නොඑසේ නම්, අදාළ පළාත් සභාව මඟින්ද;

(iv) ඒ අනුව, මේ වනවිට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම ජාතික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කර ඒවා රේඛීය අමාත්‍යාංශය යටතට ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

583/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාව මඟින් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) එම මධ්‍යස්ථාන අතරින් ඉදිකිරීම් අතරමඟ නවතා දමා ඇති ගොඩනැගිල්ලක් ඇති මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(vi) එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අතරමඟ නවතා දැමීමට හේතු කවරේද;

(vii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර එය තරුණ ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

605/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ලියාපදිංචි කර ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල සේවයේ නියුතු පෙර පාසල් පාලිකාවන් සපුරාලිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම කවරේද;

(iii) මේ වනවිට සේවයේ නියුතු පෙර පාසල් පාලිකාවන් අතරින් ඉහත සඳහන් අවම අධ්‍යාපන සුදුසුකම සපුරා ඇති පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) සෑම පෙර පාසලක් සඳහාම එකම විෂය නිර්දේශයක් හෝ එවැනි මග පෙන්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පාසල්, ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික, විශ්වවිද්‍යාල හා වෙනත් අධ්‍යාපන අංශ අතරින් අතිශය තීරණාත්මක සහ වැදගත් අංශය පෙර පාසල් අධ්‍යාපනය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පෙර පාසල් අධ්‍යාපනය සෘජුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් කර වඩාත් ඵලදායී ලෙස සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

703/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විද්‍යාව හා තාක්ෂණය ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතින ලෝකයේ කාලීන ප්‍රවණතාවලට අනුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු බව පිළිගන්නේද;

(ii) පිළිගත් නිර්ණායකවලට අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කොපමණ වසර ගණනකට වරක් සිදු කළ යුතුද;

(iii) ශ්‍රී ලංකාවට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජුනි 05 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

612/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම අරමුදලට පරිත්‍යාග ලෙස ලැබුණු මුදල කොපමණද;

(iii) එම අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(iv) එම අරමුදලට පරිත්‍යාග ලෙස ලැබුණු මුදල්, එම අරමුදලේ අරමුණුවලට පරිබාහිර කටයුතු සඳහා යොදවා තිබෙන බව ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

632/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඊශ්‍රායල් ජාතිකයන්ගේ ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, ඒවා පිහිටුවා ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඒ සඳහා නීත්‍යානුකූලව අවසර ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සාත්තු සේවක තනතුර සඳහා ඊශ්‍රායලයට පිටත්ව ගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට ගන්නා ලද පියවර කවරේද;

(iv) විනිවිදභාවයකින් යුතුව ඉහත රැකියා ලබා දීමට ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

649/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අසාද් මවුලානා යන අය විසින් චැනල් 4 නාලිකාවට ප්‍රකාශයක් කරන ලද දිනය කවරේද;

(ii) එම ප්‍රකාශය සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වූ බව දන්නේද;

(iii) අසාද් මවුලානා යන අය ශ්‍රී ලංකාවට ගෙන්වා ගෙන, ඒ සම්බන්ධයෙන් වැඩිදුර ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

668/2025

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය සත්‍යමූර්ති තංගමුත්තු මහතා පසුගිය වර්ෂ තුන මුළුල්ලේ පුද්ගලයින් 170 දෙනකු රාජ්‍ය අංශය තුළ සේවයේ යොදවා ඇති බවත්,

(ii) එම සේවකයින්ට ඔවුන්ගේ මාස 36 ක සේවා කාලයෙන් මාස 5ක උපරිම කාලයක් සඳහා පමණක් මාසයකට රුපියල් 10,000කට වඩා අඩු මුදලක් බැගින් ගෙවන ලද බවත්;

(iii) එවැනි රැකියා නියුක්ති පිළිවෙත් මඟින් ශ්‍රී ලංකාවේ කම්කරු නීති උල්ලංඝණය කරනු ලැබ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සේවකයින් කුමන පදනමක් මත රාජ්‍ය අංශයට පත් කරන ලද්දේද;

(ii) මෙම සේවකයින්ගේ වත්මන් රැකියා නියුක්ති තත්ත්වය කෙබඳුද;

(iii) දැනට මාස දෙකකට වැඩි කාලයකට පෙර මේ සම්බන්ධයෙන් ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබියදී පවා වෛද්‍ය තංගමුත්තු මහතාට එරෙහිව ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

702/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලියෝඩේ ගංගාව ආශ්‍රිත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දීඝවාපිය සිට කලියෝඩේ දක්වා කිලෝ මීටර් 04ක් දිගින් යුතු ප්‍රධාන ඇළ මාර්ගය නිරන්තරයෙන් කැඩී යාම හේතුවෙන් අක්කරේපත්තුව, අඩ්ඩාලචේන, ඔලුවිල් සහ පාලමුනේ යන ප්‍රදේශවල කුඹුරු ඉඩම් අක්කර දහස් ගණනක් දැඩි ලෙස හානියට පත් වන බව දන්නේද;

(ii) ඉහත සඳහන් ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුවක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තු ගත වියදම කොපමණද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

714/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ රජයේ දෙමළ මාධ්‍ය පාසල් තිබේද;

(ii) එසේ නම්, එම පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස. (උ. පෙළ) දක්වා අධ්‍යාපනය ලබා දෙන පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ඇති අ.පො.ස. (උ. පෙළ) විෂයයන් දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය හැකි පාසල් කවරේද;

(ii) ඒ අතරින් කලා හා වාණිජ විෂය ධාරාවන් දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය හැකි පාසල් කොපමණද;

(iii) ගණිත, විද්‍යා හා තාක්ෂණවේදය විෂය ධාරාවන් දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය හැකි පාසල් තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සියලුම විෂය ධාරාවන් දෙමළ භාෂාවෙන් හැදෑරිය හැකි රජයේ පාසල් කළුතර දිස්ත්‍රික්කයේ තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එවැනි එක් පාසලක් හෝ කළුතර දිස්ත්‍රික්කයේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

719/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය යහපාලන රජය පැවති කාලසීමාව තුළ "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මොනරාගල දිස්ත්‍රික්කය තුළ රජයේ පාසල්වල ආරම්භ කරන ලද ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත සඳහන් ඉදිකිරීම් අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති සංඛ්‍යාව හා වැඩ අවසන් කර නොමැති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වැඩ අවසන් කර නොමැති ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

772/2025

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් වැලිසර, ගබඩා සංකීර්ණයේ කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය එක් රැස් කර ඇති බව දන්නේද;

(ii) ඒවා එම ස්ථානයට එක් රැස් කිරීමට හේතුව කවරේද;

(iii) ඒවා කල් ඉකුත් වීමට හේතුව කවරේද;

(iv) මෙලෙස ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

854/2025

ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිඅත්තකණ්ඩිය නගරයේ 'මන්සල' හා 'හෙළ බොජුන් හල' අසල අක්කර දෙකක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් පුද්ගලයන් දෙදෙනෙකුට බැහැර කර ඇති බව දන්නේද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, බැහැර කිරීමේ පදනම සහ අරමුණ කවරේද;

(iii) පොලිසිය හා 'ශාලිකා ශාලාව' අතර පර්චස් 60ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් බැහැර කර තිබේද;

(iv) එසේ නම්, බැහැර කර ඇත්තේ කවුරුන්ටද සහ එහි අරමුණ කවරේද;

(v) සංස්කෘතික මධ්‍යස්ථානය අසල ඉඩම කැබලි කර බැහැර කර තිබේද;

(vi) එසේ නම්, බැහැර කරන ලද පුද්ගලයාගේ නම සහ බැහැර කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දෙහිඅත්තකණ්ඩිය නගර සංවර්ධන සැලසුමක් සකස් කිරීමට සැලසුම් කර ඇති අතර ඉහත සඳහන් ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා භාවිතා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ඉඩම් මේ වනවිට බැහැර කර ඇති ආකාරය අනුව එම සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කළ හැකිද;

(iii) නොඑසේ නම්, එම බැහැර කිරීම සංශෝධනය කළ හැකිද;

(iv) එම ඉඩම් ආපසු ලබා ගත හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූනි 06 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු කවරේද;

(iv) ඒවායේ ව්‍යාපාරික හා පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

74/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතීවුපට්රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පලුකාමම් ප්‍රදේශයේ පිහිටා ඇති තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් නොමැති අතර එම තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එය ඉදිකරනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

95/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන වරායන් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් වරායේ ආදායම හා වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වරායන් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

158/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයාගේ නම කවරේද;

(ii) ඔහුගේ සුදුසුකම් කවරේද;

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම්, මේ දක්වා දරා ඇති තනතුරු, එම පෙර තනතුරු දරන ලද ආයතනය සහ වර්තමානයේදී වෙනත් ආයතනවල දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජය සතු සීනි සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2022 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සීනි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජය සතු සීනි කර්මාන්තශාලාවල මේ වනවිට විකුණා ගත නොහැකිව එක්රැස් වී ඇති සීනි ප්‍රමාණය සහ එතනෝල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

214/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරවල නම් කවරේද;

(iii) එම එක් එක් බන්ධනාගාරයේ මේ වනවිට රඳවා ඇති සිරකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බන්ධනාගාරවල පවතින අධික තදබදය අවම කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

223/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අපනයන සැකසුම් කලාපය සඳහා ඉඩම් පවරා ගැනීමේ ප්‍රගතිය කවරේද;

(ii) පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වනවිට ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

(iii) ඉහත අපනයන සැකසුම් කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට, එම කලාපයට නල ජලය ලබා දීමට සහ විදුලිය සැපයීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ප්‍රගතිය කවරේද;

(v) ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් ලෙස සලකා ඉහත අපනයන සැකසුම් කලාපයේ ඉතිරි සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

390/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටු කාර්යාලය එවකට අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කරනු ලැබුවේද;

(ii) එම කමිටුව ස්ථාපිත කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඉදිරිපත් කරන්නේද;

(iii) එම කමිටුවේ සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දූෂණ විරෝධී කමිටු කාර්යාලය වසා දමන අවස්ථාව වනවිට එම කාර්යාලය වෙත ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(vi) පවරා තිබූ නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය කවරේද;

(ii) ඔහු අනවසරයෙන් වාහනයක් ධාවනය කර එය අනතුරකට පත් කර ඇති බව දන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

619/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී "මහවැලි පුනරුද සතිය" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(ii) එම වැඩසටහනේ අරමුණ කවරේද;

(iii) එම වැඩසටහන සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) මහවැලි ගොවීන් බල ගැන්වීම සඳහා එම වැඩසටහන යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

917/2025

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ද්විත්ව පුරවැසිභාවය හිමි ඇතැම් පුද්ගලයින් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් ලෙස සේවය කරන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එවැනි තානාපතිවරුන්ගේ සහ මහ කොමසාරිස්වරුන්ගේ නම්, ඔවුන්ගේ පත්වීම් දිනයන් සහ අනෙකුත් අදාළ තොරතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහළ මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සඳහා ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයින් පත් කිරීම මඟින් බැඳියා පිළිගැටුම් ඇතිවීමේ විභවයක් ඇති බව එතුමා දන්නේද;

(iv) එසේ නම්, එවැනි බැඳියා පිළිගැටුම් වැළැක්වීම/ආමන්ත්‍රණය කිරීම සඳහා ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරහ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලටද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවි කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතනවන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදුම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/2025

ගරු රුවන් මාපලගම මහතා,— පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්මය ඇතුළත් කිරීම,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, එබැවින් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාල නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.